රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 06/2015

මගේ අංකය : EST-1/MISCL/06/0032

රාජ්‍ය පරිපාලන සහ

කළමනාකරණ අමාත්‍යාංශය

නිදහස් චතුරස්‍රය

කොළඹ 07.

2015.11.24

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ නිලධරයන්ගේ නියෝජන ඉහළ බලධරයන් වෙත ඉදිරිපත් කිරීම

ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදයේ 5 සහ 6 වගන්ති කෙරේ ඔබේ අවධානය යොමු කරවමි.

02. තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ වෙනත් අදාළ බලධරයෙකුගේ අනුදැනුමකින් තොරව රජයේ නිලධරයන් විසින් ස්වකීය අභියාචන ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ගෙන් බැහැරව සෘජුවම ඉහළ බලධරයන් වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවක් වර්ධනය වී ඇති බව නිරීක්ෂණය වන අතර එය ඉතා අසතුටුදායක තත්ත්වයකි.

උදා:- සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙකු ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් හෝ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ අනුදැනුමකින් තොරව සෘජුවම මාවෙත අභියාචනා ඉදිරිපත් කිරීම.

03. කිසියම් නිලධරයකු විසින් ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදයේ 5 සහ 6 වගන්ති අනුගමනය නොකර ස්වකීය නියෝජනයක් බලධරයකු වෙත ඉදිරිපත් කළ අවස්ථාවකදී එසේ කටයුතු කිරීමට පාදක වූ කරුණු පරීක්ෂා කර විශේෂිත හේතුවක් නොමැති බවට කරුණු අනාවරණය වන්නේ නම් එම නිලධරයාට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු ය.

04. එසේම සියලුම මට්ටම්වල අධීක්ෂණ නිලධරයන්ට ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය වෙත අවධානය යොමු කර එහි අනෙකුත් වගන්තීන්ට යටත්ව 5:1 වගන්තිය පරිදි කටයුතු කිරීමට උපදෙස් නිකුත් කල යුතුය. එසේ කිසියම් නිලධරයෙකු විසින් නිසි පරිදි ඉදිරිපත් කළ ඉල්ලීමක් හෝ අභියාචනයක් නිසි බලධරයා වෙත ඉදිරිපත් නොකරන අධීක්ෂණ නිලධරයකු සම්බන්ධයෙන් ද ඉහත 03 පරිදිම විනයානුකූලව කටයුතු කළ යුතු ය.

ජේ.දඩල්ලගේ

ලේකම්

රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය